2017 මැයි 13 යොමු අංකය: 1617-063

දයාබර දෙමව්පියන් වෙත,

**වෙසක් ළමා සිල් පිංකම 2017 - ඡායාරූප**

අප දහම් පාසලේ දරු දැරියන් සඳහා, මැයි මස 12 වැනිදා සිකුරාදා පැවැත්වූ ළමා සිල් පින්කම ඉතා සාර්ථක ලෙස පැවැත්විණ.

350ට වැඩි දරුවන් පිරිසක් සමග දහම් පාසලේ ගුරු මණ්ඩලයේ ගුරු මෑණිවරුන් සහ ගුරු පියවරුන්ද මෙම සීල සමාදානයට සහභාගී වූ අතර ඩුබායි හි ශ්‍රී ලංකාරාම භාවනා මධ්‍යස්ථානයේ ස්වාමින්වහන්සේ විසින් සහභාගී වූ පිරිස උපොසථ අෂ්ටාංග සීලයෙහි පිහිටුවා දරුවන් සඳහා අනුශාසනාවක්ද පවත්වන්නට යෙදුනි. ඉන් අනතුරුව සිල් සමාදන් වූ දරුවන් සඳහා විශේෂිත වූ දහම් වැඩ සටහන් කිහිපයක්ද පැවැත්විණ.

ඩුබායි හි ඕල්කොට් ආදී ශිෂ්‍ය සංවිධානය විසින් සිල් සමාදන් වූ දැරියන්, ගුරු මණ්ඩලය සහ උපස්ථායක කණ්ඩායම සඳහා උදැසන හීල් දානය පිරිනමන ලද අතර දහම් පාසලේ දෙමාපියන්ගේ සහයෝගයෙන් දහවල් දානය පිරිනමන ලදී.

**සීල සමාදාන පින්කමේ ඡායාරූප බලන්න මෙතනින්**

තෙරුවන් සරණයි!

**ස්තුතියි,**

**සංවිධායක මණ්ඩලය**

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org